පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව - උතුරු මැද පළාත
மாகாணக் கல்வித் திணைக்களம் - வட மத்திய மாகாணம்
DEPARTMENT OF EDUCATION – NORTH CENTRAL PROVINCE

ශ්‍රේණිය 10

# තෙවන වාර පරීක්ෂණය - 2023

විෂයය :- **කතෝලික ධර්මය I, II**

පාසලේ නම : ..........................................................................

ඇතුළත්වීමේ අංකය : ...............................

**කාලය : පැය 03 යි මිනිත්තු 10 යි.**

## කතෝලික ධර්මය I

**සැලකිය යුතුයි.**

(i) **සියලු ම** ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

(ii) අංක 1 සිට 40 තෙක් ප්‍රශ්නවල, දී ඇති (1), (2), (3), (4) යන පිළිතුරුවලින් **නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ** පිළිතුර තෝරා ගන්න.

(iii) **ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරෙන් ඔබ තෝරාගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුළ (X) ලකුණ යොදන්න.**

01. ගැලවීමේ ඉතිහාසයෙහි පරමාර්ථය වන්නේ,
(1) දේව විශ්වාසය වර්ධනය කිරීම යි. (2) දෙවියන් වහන්සේ පිළිබඳ අනාවරණය කිරීම යි.
(3) දේව ප්‍රේමය බෙදා දීම යි. (4) ගැලවුම්කරුවාණන්ට ලෝකය සූදානම් කිරීම යි.

02. ශුද්ධ බයිබලයෙහි අන්තර්ගත නොවන යමක් ශුද්ධ වූ කතෝලික සභාව අනුගමනය කරන්නේ ද ඒවා ලැබී ඇත්තේ,
(1) ගැලවීමේ ඉතිහාසයෙනි. (2) වාචික සම්ප්‍රදායෙනි.
(3) ජීවන සහා සම්ප්‍රදායෙනි. (4) කතෝලික සභා ධර්මෝපදේශයෙනි.

03. ශුද්ධ වූ ලූක් සුබාරංචියේ දෙවන කාණ්ඩය ලෙස සැලකෙන්නේ,
(1) එළිදරව්ව පොත යි. (2) අපෝස්තුළුවරුන්ගේ ක්‍රියා පොත යි.
(3) ජාකොබ් ලිපිය යි. (4) 1 කොරින්ති ලිපිය යි.

04. ශුද්ධ වූ පාවුලු තුමා විසින් ම ලියන ලද පෞද්ගලික ලිපියක් වන්නේ,
(1) තීතස් (2) ගලාති (3) පිලමොන් (4) 1 තිමති

05. වෙනත් සංදේශවල කර්තෘත්වය හිමි වන අපෝස්තුළුවරුන් වන්නේ,
(1) පේදුරු, පාවුලු, ජූද් හා ඇන්ඩෘ තුමන්ලා ය. (2) ඇන්ඩෘ ජොහාන්, ජාකොබ් හා ලූක් තුමන්ලා ය.
(3) ජූද්, ජොහාන්, මතෙව් හා පේදුරු තුමන්ලා ය. (4) පේදුරු, ජොහාන්, ජූද් හා ජාකොබ් තුමන්ලා ය.

06. එළිදරව්ව පොත රචනා වූයේ,
(1) හතරවන ඇන්ටිඕකස්ගේ පීඩන සමයේ දී ය. (2) ඩොමීෂියන් අධිරාජ්‍යයාගේ පීඩන සමයේ දී ය.
(3) නීරෝ අධිරාජ්‍යයාගේ පීඩන සමයේ දී ය. (4) නබුකද්නෙෂර් රජුගේ පීඩන සමයේ දී ය.

07. එළිදරව් සාහිත්‍යයේ අංක 7 න් සංකේතවත් වන්නේ,
(1) විශ්වය යි. (2) පූර්ණත්වය යි. (3) පරිපූර්ණත්වය යි. (4) දේව ජනතාව යි.

08. ප්‍රඥා සාහිත්‍යයට අයත් ග්‍රන්ථ පමණක් ඇතුළත් පිළිතුර තෝරන්න.
(1) ජෝබ්, ගීතාවලිය, ධර්මදේශකයා (2) ගීතාවලිය, ප්‍රේම ගී, නෙහෙමියා
(3) සිරාක්, එස්රා, ජෝවෙල් (4) දානියෙල්, ජෝබ්, ප්‍රේම ගී

09. එම්මාවුස් නම් ගමට යමින් සිටි ගෝලයන් දෙදෙනා ජේසුස් වහන්සේව හඳුනා ගත්තේ,
(1) ඔවුන් සමග කතා කරමින් යන විට ය. (2) ආශිර්වාද කර පූප කඩන විට ය.
(3) ශුද්ධ ලියවිල්ල පැහැදිලි කරන විට ය. (4) ඔවුන්ගෙන් සමුගන්නට සූදානම් වූ විට ය.

10. A 'පියාණනී ඔවුන්ට කමා වුව මැනව. ඔවුන් කරන දෙය ඔවුහු නොදනිති.'
B 'මෙතැන් පටන් මනුෂ්‍ය පුත්‍රයාණන් දෙවියන් වහන්සේගේ බලපරාක්‍රමයේ දකුණු පස වැඩහිඳිනු ඇත.'
C 'ඔබ මා සමග අද ම පාරාදීසයෙහි සිටින්නෙහි ය.'
D 'පියාණනී, ඔබගේ හස්තයට මගේ ආත්මය භාර දෙමි.'
ඉහත ප්‍රකාශ අතරින් ජේසුස් වහන්සේ කුරුස ගසේ දී කරන ලද ප්‍රකාශ පමණක් ඇතුළත් පිළිතුර තෝරන්න.
(1) A,B හා C ය. (2) B,C හා D ය. (3) A,C හා D ය. (4) A,B හා C ය.

11. නැඹුල් එල ඔප්පු කරමින්, දෙවියන් වහන්සේට තුති පුදන ජුදා මංගල්‍යය කුමක්ද?
(1) පාස්කු මංගල්‍යය (2) පෙන්තකොස්ත මංගල්‍යය (3) කූඩාරම් මංගල්‍යය (4) නත්තල් මංගල්‍යය

12. ගල්ගසා මරණයට පත් කළ, ශුද්ධ වූ සභාවේ පළමු ප්‍රාණ පරිත්‍යාගිවරයා කවුරුන් ද?
(1) ශුද්ධ වූ පේදුරු තුමා (2) ශුද්ධ වූ පාවුලු තුමා
(3) ශුද්ධ වූ මහා ජාකොබ් තුමා (4) ශුද්ධ වූ ස්තේපන් තුමා

13. මුල් කිතුනු සභාව තුළ උපස්ථායකයන්ට පැවරුණු ප්‍රධාන කාර්යය වූයේ,
(1) සුබාරංචිය දේශනා කිරීම ය. (2) අපෝස්තුළුවරුන්ට සහය වීම ය.
(3) සහනාධාර බෙදා දීම ය. (4) ජනවන්දනාව සංවිධානය කිරීම ය.

14. ශුද්ධ වූ පාවුලු තුමා ස්ථාපිත කළ සභාවන් හී විවිධ ගැටලු නිරාකරණය කිරීමට එතුමා ගත් ක්‍රියාමාර්ගයක් වන්නේ,
(1) සංදේශ ලියා යැවීම (2) අපෝස්තුළුවරුන් යැවීම
(3) එම සභාවල නායකයන් පත් කිරීම (4) නිරන්තරයෙන් සභාවන් බැහැදැකීම

15. ශුද්ධ වූ පාවුලු තුමා සමග දෙවන ධර්මදූත චාරිකාවට ආරම්භයේ දී එක් වන්නේ,
(1) බර්ණබස් තුමා ය. (2) සීලස් තුමා ය. (3) තිමෝතියස් තුමා ය. (4) ලූක් තුමා ය.

16. ශුද්ධ වූ පේදුරුතුමා සමග ක්‍රිස්තු අනුගාමිකත්වය ලැබූ ශ්‍රාවකයෙක් **නොවන්නේ**
(1) ශුද්ධ වූ ඇන්ඩෘ තුමා (2) ශුද්ධ වූ ජොහාන් තුමා
(3) ශුද්ධ වූ ජාකොබ් තුමා (4) ශුද්ධ වූ මතෙව් තුමා

17. අති උතුම් ෆ්‍රැන්සිස් ශුද්ධෝත්තම පියතුමාගේ මුල් නම කුමක්ද?
(1) කැරොල් ජෝශප් වොජිටිල්ලා (2) ජෝශප් රැට්සිංගර්
(3) ජෝර්ජ් මාරියෝ බර්ගෝලියෝ (4) මාරියෝ හෝස්

18. අපෝස්තුළුවරයා යනු,
(1) දේව වරප්‍රසාද ලද තැනැත්තා ය. (2) ශ්‍රාවකත්වය ලැබූ තැනැත්තා ය.
(3) ගැලවීම ලද තැනැත්තා ය. (4) යවනු ලැබූ තැනැත්තා ය.

19. හත්වන බුවනෙකබාහු රජුගේ ඉල්ලීමට අනුව ලංකාවට පළමු ධර්මදූත කණ්ඩායම පැමිණියේ,
(1) 1505 දී ය. (2) 1543 දී ය. (3) 1605 දී ය. (4) 1606 දී ය.

20. වර්තමානයේ ශ්‍රී ලංකා කතෝලික සභාවේ රදගුරු පදවි ගණන,
(1) 11 කි. (2) 12 කි. (3) 15 කි. (4) 18 කි.

21. දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ පිළිබඳ පූර්ව සලකුණක් වන්නේ,
(1) මෙල්කිසදෙක්ගේ යාගය (2) කානා නුවර ජලය මිදියුෂ බවට හැරවීම
(3) රතු මුහුදින් එතෙරවීම (4) කල්වාරි යාගය

22. දිව්‍ය සත්ප්‍රසාද පිළිවෙතේ යථාර්ථය ඉස්මතු කරන අවස්ථාවක් වන්නේ,
(1) අන්‍යරූපවිලාශ වීම යි. (2) පූප කැඩීම යි.
(3) ශ්‍රාවකයන්ගේ පාද දෝවනය යි. (4) නාසරෙත්හී දේශනය යි.

23. නව ගිවිසුමේ බැටළු පෝතකයාණන්, උත්තම පූජකයාණන් වන්නේ,
(1) මෙල්කිසදෙක් ය. (2) ක්‍රිස්තුන් වහන්සේ ය. (3) මෝසෙස් තුමා ය. (4) අන්නාස් ය.

24. නොදවන පූජා සඳහා යොදා ගනු ලබන්නේ,
(1) බැටළුවන් (2) එළුවන් (3) පූප (4) පරවියන්

25. ශුද්ධ වූ දෙවන ජුවාම් පාවුලු ශුද්ධෝත්තම පියතුමන් ශ්‍රී ලංකාවට වැඩම කළේ,
(1) 1990 දී ය. (2) 1991 දී ය. (3) 1985 දී ය. (4) 1995 දී ය.

26. A ලොරෙට්ටෝ පැවිදි නිකාය ආරම්භ කළා ය.
B ගුරුවරියක ලෙස සේවය කළා ය.
C 'ජීවමාන සාන්තුවරිය' යන විරුදාවලිය ලැබුවා ය.
D ඒඩ්ස් රෝගීන් සඳහා නිව්යෝක් නගරයේ රෝහලක් විවෘත කළා ය.
E 'සත්‍යය' නම් ලිපියක් ප්‍රකාශයට පත් කළා ය.
ඉහත ප්‍රකාශ අතරින් භාග්‍යවත් තෙරේසා මව්තුමිය හා සම්බන්ධ නිවැරදි ප්‍රකාශ පමණක් ඇතුළත් පිළිතුර තෝරන්න.
(1) A,B හා C ය. (2) B,C හා E ය. (3) B,C හා D ය. (4) A,C හා E ය.

27. ''යමෙකු තමාගේ මිතුරන් උදෙසා දිවි පිදීමට වඩා උතුම් ප්‍රේමයක් කිසිවකුට නැත'' යන්න ආදර්ශ පාඨය වූයේ,
(1) ගරු මයිකල් රුද්‍රිගු පියතුමාගේ ය. (2) ශුද්ධ වූ මැක්සිමිලියන් කෝල්බේ මුනිතුමාගේ ය.
(3) භාග්‍යවන්ත තෙරේසා මව්තුමියගේ ය. (4) ශුද්ධ වූ මරිය ගොරෙත්ති තුමියගේ ය.

28. පළමු දේව පනත පදනම් වන්නේ,
(1) විශ්වාසය, ප්‍රඥාව, ගැලවීම මත යි. (2) දේව අනාවරණය මත යි.
(3) ශුද්ධ වූ ත්‍රිත්වය මත යි. (4) විශ්වාසය, බලාපොරොත්තුව, ප්‍රේමය මත යි.

29. කතෝලිකයකු වූ කපිල නැකතට අනුව තම නිවසට මුල් ගල තැබුවේ ය. ඔහු කඩ කළ දේව පනත වන්නේ,
(1) පළමු පනත යි. (2) දෙවන පනත යි. (3) තුන්වන පනත යි. (4) හතරවන පනත යි.

30. බලාපොරොත්තුවට විරුද්ධ පාපයක් වන්නේ,
(1) අනුමානය යි. (2) අවමානය යි. (3) හීනමානය යි. (4) අභිමානය යි.

31. ගබ්සාව බරපතල පාපයක් වන්නේ,
(1) පාපොච්චාරණයේ දී සමාව දීමට රදගුරුතුමාගේ අවසරය ලබා ගත යුතු නිසා ය.
(2) පිළිසිඳගත් මොහොතේ සිට ජීවිතය දෙවියන් වහන්සේට අයිති නිසා ය.
(3) පාපොච්චාරණයේ දී සමාව නොදෙන නිසා ය.
(4) දෙවියන් වහන්සේ උන්වහන්සේගේ මැවිල්ලට ආදරය කරන නිසා ය.

32. ''මරණයට පත් වුනත් මම මාගේ දේව ජීවිතය නැති කර ගන්නේ නෑ'' මෙම ප්‍රකාශය හා සම්බන්ධ සාන්තුවරිය වන්නේ,
(1) ශුද්ධ වූ ආනා තුමිය යි. (2) ශුද්ධ වූ මරිය ගොරෙත්ති තුමිය යි.
(3) ශුද්ධ වූ මරිය මග්දලේනා තුමිය යි. (4) ශුද්ධ වූ ඇග්නස් තුමිය යි.

33. පෞද්ගලික දේපළ නිවැරදි ව පරිහරණය කිරීමට අපට මගපෙන්වන දේව පනත් වන්නේ,
(1) හතර, පහ දේව පනත් ය. (2) හය, නවය දේව පනත් ය.
(3) හත, අට දේව පනත් ය. (4) හත, දහය දේව පනත් ය.

34. තම වරද අන් අය පිට පැටවීම .......................... විරුද්ධ පාපයකි. මෙහි හිස්තැනට යෝග්‍ය පිළිතුර තෝරන්න.
(1) පස්වන පනතට (2) හයවන පනතට (3) අටවන පනතට (4) දසවන පන

35. චතාරික හා පාස්කු සමයේ දී ජනවන්දනාව සඳහා යොදා ගනු ලබන්නේ,
(1) ශු. මතෙව් සුබාරංචිය යි. (2) ශු. මාක් සුබාරංචිය යි.
(3) ශු. ලූක් සුබාරංචිය යි. (4) ශු. ජොහාන් සුබාරංචිය යි.

36. දේව ජනතාව වන්දනා ගමනක යෙදෙන බව සිහිපත් කරන්නේ,
(1) ඇතුළුවීමේ පෙරහැරෙනි. (2) දිව්‍ය සත්ප්‍රසාද පෙරහැරෙනි.
(3) පඬුරු පෙරහැරෙනි. (4) පාදනමස්කාරයෙනි.

37. සුරදූත ගීය ගායනා **නොකරන්නේ**,
(1) චතාරික හා ආගමන කාලය තුළ ය. (2) ආගමන හා නත්තල් කාලය තුළ ය.
(3) චතාරික හා පාස්කු කාලය තුළ ය. (4) චතාරික කාලය තුළ පමණි.

38. දේව වාක්‍යය පිළිවෙතේ කොටස්වලට අයත් කොටසක් **නොවන්නේ,**
(1) ස්වාමිවාක් ආරාධනාව (2) සාධුකාරය (3) ධර්මානුශාසනාව (4) විශ්වාසකයින්ගේ යැදුම්

39. උත්තම පූජක යාච්ඤාව පුරා දිවයන එක් ප්‍රධාන තේමාවක් වන්නේ,
(1) විශ්වාසය යි. (2) ප්‍රේමය යි. (3) දේව දයාව යි. (4) එකමුකම යි.

40. මල් උයනේ යාච්ඤාව මගින් අපට ඉදිරිපත් කරන ප්‍රබල පණිවිඩය වන්නේ,
(1) ජේසුස් වහන්සේ තමන් වහන්සේගේ දුක් ප්‍රාප්තිය පිය දෙවිඳුන්ට භාර දුන් බව ය.
(2) සෑම දුක් කරදරයකදී ම දෙවි පියාණන් වහන්සේගේ පිහිට පතා යාච්ඤා කළ යුතු බව ය.
(3) ජීවිතයේ සෑම වැදගත් අවස්ථාවකට ම යාච්ඤාවෙන් සූදානම් විය යුතු බව ය.
(4) යාච්ඤා කිරීමේ දී නිදහස් නිස්කලංක පරිසරයකට යා යුතු බව ය.

(ලකුණු 1X40=40)

පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව - උතුරු මැද පළාත
மாகாணக் கல்வித் திணைக்களம் - வட மத்திய மாகாணம்
DEPARTMENT OF EDUCATION – NORTH CENTRAL PROVINCE

| ශ්‍රේණිය |
| --- |
| 10 |

# තෙවන වාර පරීක්ෂණය - 2023

විෂයය :- **කතෝලික ධර්මය II**

(i) **පළමු ප්‍රශ්නය** හා තවත් ප්‍රශ්න **හතරක්** ඇතුළුව ප්‍රශ්න **පහකට** පමණක් පිළිතුරු සපයන්න.
(ii) **පළමුවන ප්‍රශ්නයට ලකුණු 20 ක් ද, තෝරා ගන්නා එක් ප්‍රශ්නයකට ලකුණු 10 බැගින් ද හිමි වේ.**

01. (i) ජනතාවගේ ගැටලු හා ඒවාට විසඳුම් දේව වේදීය දෘෂ්ටි කෝණයකින් ඉදිරිපත් කර ඇති ජනප්‍රිය ඓතිහාසික කෘතීන් **දෙක** නම් කරන්න. (ලකුණු 2)
(ii) එළිදරව් සාහිත්‍යයේ ලක්ෂණ **දෙකක්** ලියන්න. (ලකුණු 2)
(iii) හෙබ්‍රෙව් ප්‍රඥාවේ ප්‍රභේද **දෙකක්** ලියන්න. (ලකුණු 2)
(iv) ජේසුස් වහන්සේ උකුත් වූ අවස්ථාවේ සිදු වූ සිදුවීම් **දෙකක්** ලියන්න. (ලකුණු 2)
(v) ශුද්ධ වූ සභාව තුළ පැවතිය යුතු අනිවාර්ය ලක්ෂණ **දෙකක්** ලියන්න. (ලකුණු 2)
(vi) ගෞරවනීය ජාකෝමේ ගොන්සාල්වෙස් පියතුමා විසින් රචිත ග්‍රන්ථ **දෙකක්** නම් කරන්න. (ලකුණු 2)
(vii) දිව්‍ය පූජා යාගය සිදු කිරීමේ ප්‍රධාන අරමුණු **දෙකක්** ලියන්න. (ලකුණු 2)
(viii) මයපීඩාව ඇති ව දිවි ගෙවන්නට කළ යුතු කාර්යයන් **දෙකක්** ලියන්න. (ලකුණු 2)
(ix) දිව්‍ය පූජාව තුළ දක්නට ලැබෙන ගෞරවයේ සංකේත **දෙකක්** ලියන්න. (ලකුණු 2)
(x) කිතුනු සභා ප්‍රධාන වශයෙන් බෙදා දැක්විය හැකි කොටස් **දෙක** නම් කරන්න. (ලකුණු 2)

02. (i) ශුද්ධ වූ පාවුලු තුමා ලිපි ලිවීමේ පරමාර්ථ **දෙක** ලියන්න (ලකුණු 2)
(ii) නව ගිවිසුමේ ඇතුළත් වෙනත් හසුන් හඳුන්වන නම් **තුනක්** ලියන්න. (ලකුණු 3)
(iii) ශුද්ධ වූ පාවුලු තුමාගේ ආදර්ශය අනුව යමින් අන් අය වෙත සුබාරංචිය රැගෙන යාමට ඔබේ හැකියා දක්ෂතා යොදා ගන්නා ආකාරය කරුණු **පහකින්** විස්තර කරන්න. (ලකුණු 5)

03. (i) දිව්‍ය සත්ප්‍රසාදීය ලක්ෂණ **දෙකක්** ලියන්න. (ලකුණු 2)
(ii) ජුදා පාස්කු භෝජනයෙහි මූලිකාංග **තුනක්** ලියන්න. (ලකුණු 3)
(iii) දිව්‍ය සත්ප්‍රසාදීය භෝජනයට පංගුකාර වන ඔබට ජේසුස් ක්‍රිස්තුන් වහන්සේ මෙන් අන් අය වෙනුවෙන් කැඩී බිඳී වැය වීමට සිදුවන අවස්ථා **පහක්** විස්තර කරන්න. (ලකුණු 5)

04. (i) මිනිස් ජීවිතය අන් සියලු මැවිලිවලට වඩා වැදගත් වීමට හේතු **දෙක** ලියන්න. (ලකුණු 2)
(ii) පස්වන දේව පනතට විරුද්ධ ක්‍රියා **තුනක්** ලියන්න. (ලකුණු 3)
(iii) මිනිස් ජීවිතය දෙවියන් වහන්සේට පමණක් අයිති බැවින් තමාගෙත් අන් අයගෙත් ජීවිත ආරක්ෂා කර ගැනීමට ඔබට ගත හැකි පියවර **පහක්** විස්තර කරන්න. (ලකුණු 5)

05. (i) 'ලාඕස්' සහ 'එර්ගොන්' යන වචන දෙකෙහි අර්ථ ලියන්න. (ලකුණු 2)
(ii) ශුද්ධ වූ දින ත්‍රිත්වය නම් කරන්න. (ලකුණු 3)
(iii) අර්ථවත් ලෙස දිව්‍ය පූජාවට සහභාගි වීමට ඔබට කළ හැකි කාර්යයන් **පහක්** විස්තර කරන්න. (ලකුණු 5)

06. (i) යාච්ඤාවෙන් ශක්තිය ලබා නොගත් නිසා පරීක්ෂාවට වැටුණු අපෝස්තුළුවරුන්, ජේසුස් වහන්සේ ව අත්අඩංගුවට ගැනීමට පැමිණි අවස්ථාවේ දී ක්‍රියා කළ ආකාර **දෙකක්** ලියන්න. (ලකුණු 2)
(ii) උත්තම පූජක යාච්ඤාවේ කොටස් **තුන** නම් කරන්න. (ලකුණු 3)
(iii) එදිනෙදා කටයුතු කිරීමේ දී යාච්ඤාව ඔබේ ජීවිතයට වැදගත් වන ආකාරය කරුණු පහකින් විස්තර කර ලියන්න. (ලකුණු 5)

07. පහත සඳහන් මාතෘකා අතරින් **දෙකක්** තෝරාගෙන කෙටි සටහන් ලියන්න. (ලකුණු 5X2=10)
(i) ගරු මයිකල් රුද්‍රිගු (නි.ම.නි.) පියතුමාගේ සේවාව
(ii) පුරවැසියන්ගේ වගකීම් හා යුතුකම්
(iii) ශ්‍රී ලංකාවේ අපෝස්තුළුවර ශුද්ධ වූ ජුසේ වාස් මුනිතුමා
(iv) ජේසුස් වහන්සේගේ දුක්ප්‍රාප්තිය

***

පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව - උතුරු මැද පළාත
மாகாணக் கல்வித் திணைக்களம் - வட மத்திய மாகாணம்
DEPARTMENT OF EDUCATION – NORTH CENTRAL PROVINCE

ශ්‍රේණිය 10

# තෙවන වාර පරීක්ෂණය - 2023

## කතෝලික ධර්මය I / II පිළිතුරු පත්‍රය

### කතෝලික ධර්මය I පිළිතුරු පත්‍රය

| | | |
|---|---|---|
| 01. | (1) | දේව විශ්වාසය වර්ධනය කිරීම යි. |
| 02. | (3) | ජීවන සහා සම්ප්‍රදායෙනි. |
| 03. | (2) | අපෝස්තුළුවරුන්ගේ ක්‍රියා පොත යි. |
| 04. | (3) | පිලමොන් |
| 05. | (4) | පේදුරු, ජොහාන්, ජූද් හා ජාකොබ් තුමන්ලා ය. |
| 06. | (2) | ඩොමීෂියන් අධිරාජ්‍යයාගේ පීඩන සමයේ දී ය. |
| 07. | (2) | පූර්ණත්වය යි. |
| 08. | (1) | ජෝබ්, ගීතාවලිය, ධර්මදේශකයා |
| 09. | (2) | ආශිර්වාද කර පූප කඩන විට ය. |
| 10. | (3) | A,C හා D ය. |
| 11. | (2) | පෙන්තකොස්ත මංගල්‍යය |
| 12. | (4) | ශුද්ධ වූ ස්තේපන් තුමා |
| 13. | (3) | සහනාධාර බෙදා දීම ය. |
| 14. | (1) | සංදේශ ලියා යැවීම |
| 15. | (2) | සීලස් තුමා ය. |
| 16. | (4) | ශුද්ධ වූ මතෙව් තුමා |
| 17. | (3) | ජෝර්ජ් මාරියෝ බර්ගෝලියෝ |
| 18. | (4) | යවනු ලැබූ තැනැත්තා ය. |
| 19. | (2) | 1543 දී ය. |
| 20. | (2) | 12 කි. |
| 21. | (1) | මෙල්කිසදෙක්ගේ යාගය |
| 22. | (3) | ශ්‍රාවකයන්ගේ පාද දෝවනය යි. |
| 23. | (2) | ක්‍රිස්තුන් වහන්සේ ය. |
| 24. | (3) | පූප |
| 25. | (4) | 1995 දී ය. |
| 26. | (3) | B,C හා D ය. |
| 27. | (2) | ශුද්ධ වූ මැක්සිමිලියන් කෝල්බේ මුනිතුමාගේ ය. |
| 28. | (4) | විශ්වාසය, බලාපොරොත්තුව, ප්‍රේමය මත යි. |
| 29. | (1) | පළමු පනත යි. |
| 30. | (1) | අනුමානය යි. |
| 31. | (2) | පිළිසිඳගත් මොහොතේ සිට ජීවිතය දෙවියන් වහන්සේට අයිති නිසා ය. |
| 32. | (2) | ශුද්ධ වූ මරිය ගොරෙත්ති තුමිය යි. |
| 33. | (4) | හත, දහය දේව පනත් ය. |
| 34. | (3) | අටවන පනතට |
| 35. | (4) | ශු. ජොහාන් සුබාරංචිය යි. |
| 36. | (1) | ඇතුළුවීමේ පෙරහැරෙනි. |
| 37. | (1) | චතාරික හා ආගමන කාලය තුළ ය. |
| 38. | (1) | ස්වාමිවාක් ආරාධනාව |
| 39. | (4) | එකමුකම යි. |
| 40. | (3) | ජීවිතයේ සෑම වැදගත් අවස්ථාවකට ම යාච්ඤාවෙන් සූදානම් විය යුතු බව ය. |

(ලකුණු 1X40=40)

## කතෝලික ධර්මය II පිළිතුරු පත්‍රය

01. (i) රූත් කථාව හා එස්තර් (ලකුණු 2)
(ii) ද්විත්වවාදය/ යුගාන්තවාදය/ සංකේත භාවිතය/ ආරූඪ නාමයකින් ඉදිරිපත් කර තිබීම (ලකුණු 2)
(iii) පවුල හා ගෝත්‍රික ප්‍රඥාව/ රාජ්‍ය සභා ප්‍රඥාව/ අභිධාර්මික ප්‍රඥාව/ එදිනෙදා ජීවිතය සම්බන්ධ ප්‍රඥාව (ලකුණු 2)
(iv) හිරු අඳුරු විය/ අන්ධකාරයක් පහළ විය/ දේව මාලිගාවේ තිරය දෙකඩ වී ඉරී ගියේ ය. (ලකුණු 2)
(v) ඒකත්වය/ ශුද්ධත්වය/ කතෝලිකත්වය/ අපෝස්තලිකත්වය (ලකුණු 2)
(vi) දේව වේද පුරාණය/ වේද කාව්‍යය/ පසම් පොත/ මංගල ගීතය (ලකුණු 2)
(vii) දෙවියන් වහන්සේට නමස්කාර කිරීම/ දෙවියන් වහන්සේට තුති පිදීම/ පාපයට වන්දි ගෙවීම/ ආත්මික හා ශාරීරික අවශ්‍යතා ඉල්ලා ගැනීම (ලකුණු 2)
(viii) යාච්ඤා කරන්න/ ශුද්ධ බයිබලය කියවන්න/ දිව්‍ය පූජාවට සහභාගි වන්න/ දේව ප්‍රසාද නිධාන ලබා ගැනීම (ලකුණු 2)
(ix) නමස්කාරය/ පූජාසනය සිපාවාරය/ සුවඳ දුම්/ දල්වන ලද පහන් (ලකුණු 2)
(x) පිළිගත් කිතුනු සභා/ මූලධර්මවාදී සභා (ලකුණු 2)

02. (i) කාර්ය බහුලත්වය නිසා/සිරගතව සිටීම නිසා (ලකුණු 2)
(ii) සාමාන්‍ය හසුන්/ කතෝලික සංදේශ/ විශ්ව සංදේශ/ එඬේරික හසුන් (ලකුණු 3)
(iii) සිසුන් ලියා ඇති කරුණු අනුව ලකුණු ලබා දෙන්න. (ලකුණු 5)

03. (i) දේව ප්‍රසාද නිධානයක්/ භෝජනයක්/ යාගයක්/ ගිවිසුමක්/ ස්තුති කිරීමක්/ පරිස්මරණයක් (ලකුණු 2)
(ii) පාස්කු බැටළුවා/ නුමුහුන් රොටී/ තිත්ත පලා/ මිදියුෂ (ලකුණු 3)
(iii) සිසුන් ලියා ඇති කරුණු අනුව ලකුණු ලබා දෙන්න. (ලකුණු 5)

04. (i) දේව ස්වරූපයට හා සමානකම ඇති ව මිනිසා ව මවා ඇත/ ජීවන හුස්ම ලබා දී ඇත (ලකුණු 2)
(ii) මිනී මැරීම/ මත්පැන් පානය/ ගබ්සා කිරීම ආදී පිළිතුරු (පෙළ පොත පිටු අංක 84) (ලකුණු 3)
(iii) සිසුන් ලියා ඇති කරුණු අනුව ලකුණු ලබා දෙන්න. (ලකුණු 5)

05. (i) 'ලාඕස්' - ජනතාව / 'එර්ගොන්' - වැටුපක් නොලබා කරන සේවය (ලකුණු 2)
(ii) මහා බ්‍රහස්පතින්දා/ මහා සිකුරාදා/ ආලේලූයියා සෙනසුරාදා (ලකුණු 3)
(iii) සිසුන් ලියා ඇති කරුණු අනුව ලකුණු ලබා දෙන්න. (ලකුණු 5)

06. (i) ඔවුන් වහන්සේ ව අතහැර පලායාම/ උත්තම පූජකවරයාගේ දාසයා වූ මල්කුස්ගේ කණ කැපීම/ පේදුරු තුමා තෙවරක් ඔවුන් වහන්සේ ව නාඳුනන බව ප්‍රකාශ කිරීම (ලකුණු 2)
(ii) තමන් වහන්සේ වෙනුවෙන් යාච්ඤා කිරීම/ ශ්‍රාවකයන් වෙනුවෙන් යාච්ඤා කිරීම/ අනාගත සභාවේ එකමුතුකම වෙනුවෙන් යාච්ඤා කිරීම (ලකුණු 3)
(iii) සිසුන් ලියා ඇති කරුණු අනුව ලකුණු ලබා දෙන්න. (ලකුණු 5)

07. පහත සඳහන් මාතෘකා අතරින් **දෙකක්** තෝරාගෙන කෙටි සටහන් ලියන්න. (ලකුණු 5X2=10)
(i) පෙළ පොත පිටු අංක 62, 63 (ii) පෙළ පොත පිටු අංක 79, 80
(iii) පෙළ පොත පිටු අංක 39, 40, 41 (iv) පෙළ පොත පිටු අංක 19, 20

***


LOL.lk
BookStore
විභාග ඉලක්ක
පහසුවෙන් ජයගන්න
ඕනෑම පොතක් ඉක්මනින්
නිවසටම ගෙන්වා ගන්න
| කෙටි සටහන් | පසුගිය ප්‍රශ්න පත්‍ර | වැඩ පොත් | සඟරා | O/L ප්‍රශ්න පත්‍ර
| A/L ප්‍රශ්න පත්‍ර | අනුමාන ප්‍රශ්න පත්‍ර | අතිරේක කියවීම් පොත්
| School Book | ගුරු අත්පොත්
pesuru Prakashana Private Ltd.
Akura Pilot
සමනල දැනුම
සතර
පෙර පාසලේ සිට උසස් පෙළ දක්වා සියළුම ප්‍රශ්න පත්‍ර,
කෙටි සටහන්, වැඩ පොත්, අතිරේක කියවීම් පොත්, සඟරා
සිංහල සහ ඉංග්‍රීසි මාධ්‍යයෙන් ගෙදරටම ගෙන්වා ගැනීමට
www.LOL.lk වෙබ් අඩවිය වෙත යන්න